# කාර්ය සාධන වාර්තාව
# செயலாற்றுகை அறிக்கை
# PERFORMANCE REPORT



# 2018

## භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
## திறைசேரி செயற்பாடுகள் திணைக்களம்
## Department of Treasury Operations

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

කොළඹ 01

நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சு கொழும்பு 01

Ministry of Finance and Mass Media

Colombo 01

# පටුන

පිටු අංකය


- දැක්ම . ........................................................................................ 1
- මෙහෙවර ........................................................................................ 1

1. හැඳින්වීම ........................................................................................ 2
2. ප්‍රධාන කාර්යයන් .. ........................................................................................ 2
3. සංවිධාන ව්‍යුහය ........................................................................................3
4. සේවක සංඛ්‍යා තොරතුරු …………………………………….. 4
5. මානව සම්පත් සංවර්ධනය ........................................................................................5
6. චක්‍රලේඛ හා උපදෙස්........................................................................................ 8
7. මූල්‍ය කාර්ය සාධනය ........................................................................................ 9
8. භෞතික කාර්ය සාධනය

8.1 මුදල් කළමනාකරණය ........................................................................................ 11

8.2 රාජ්‍ය ණය කළමනාකරණය ........................................................................................ 15

8.3 භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත පවරා ඇති
බදු නොවන ආදායම් එකතු කිරීම ........................................................................................ 21

8.4 භාණ්ඩාගාර ඇපකර ........................................................................................ 22

8.5 භාණ්ඩාගාර උපණය ........................................................................................ 23

8.6 භාණ්ඩාගාර කේවල ගිණුම් ක්‍රමය භාවිතා කිරීම ........................................................................................ 24

8.7 දේපල ණය ඇපකර යෝජනා ක්‍රමය . ........................................................................................ 26

8.8 භාණ්ඩාගාර මූල්‍ය කළමනාකරණ පද්ධතිය (TFMS)........................................................................................ 27

8.9. අනාගත අභියෝග ජය ගැනීම සඳහා වූ උපාය මාර්ග ........................................................................................ 28

## ➢ දැක්ම

රාජ්‍ය අරමුදල් කළමනාකරණයේ දකුණු ආසියානු කලාපයේ විශිෂ්ටතමයා බවට පත්වීම.

## ➢ මෙහෙවර

අරමුදල් ගිණුම්කරණය හා රාජ්‍ය ණය ගිණුම්කරණය පිළිබඳ භාරකාරත්වය දරමින්, රාජ්‍ය වැය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ඒකාබද්ධ අරමුදල හා වෙනත් භාණ්ඩාගාර අරමුදල් කාර්යක්ෂමව හා අරපිරිමැස්මෙන් උපයෝගී කර ගැනීම ද, ආදායම් එකතු කිරීම් හා රාජ්‍ය ණය ගැනීම් සම්බන්ධව සම්බන්ධීකාරකයෙකු ලෙස ක්‍රියා කිරීම සඳහා ද කැපවීම.


# 1. හැඳින්වීම

ඒකාබද්ධ අරමුදල් කළමනාකරණයට හා රාජ්‍ය ණය කළමනාකරණයට අදාල කරුණු සම්පාදනයට කාර්යක්ෂම සංවිධානයක් භාණ්ඩාගාරය තුළ ඇති කිරීම අරමුණු කරගෙන 2004 ජුලි 28 දින භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලදී. ඒ අනුව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් ජාතික අයවැය තුළ පුරෝකථනය කරන ලද ආදායම් සහ වියදම් මෙහෙයුම් මුදල් ගලායැම් හා ගලා ඒම් බවට පරිවර්තනය කිරීමට කටයුතු කරන අතර, වාර්ෂික ණය ගැනීමේ වැඩසටහන මගින් මූල්‍යනය කළයුතු මූල්‍ය හිඟය හඳුනා ගැනීමට ද කටයුතු කරයි. දෙපාර්තමේන්තුවේ රාජ්‍ය ණය කළමනාකරණ කටයුතු තුළ ණය සේවාකරණය හා වාර්තා කිරීමේ කටයුතු ද ඇතුලත් වේ.

# 2. ප්‍රධාන කාර්යයන්:

- භාණ්ඩාගාර මුදල් ප්‍රවාහ කළමනාකරණය
- ගෙවීම් පද්ධතිය හරහා භාණ්ඩාගාර අරමුදල් උපයෝජනය කිරීම.
- වියදම් ආයතනවල අරමුදල් අවශ්‍යතා තක්සේරු කර ප්‍රමුඛතා මත අරමුදල් නිදහස් කිරීම.
- භාණ්ඩාගාර ඇපකර නිකුත් කිරීම.
- රජයේ උපණය අයකිරීම සහ ඊට අදාල භාණ්ඩාගාර පොත්පත් පවත්වාගෙන යාම
- දෙපාර්තමේන්තුව වෙත පවරා ඇති බදු නොවන ආදායම් ශීර්ෂ 11 ක් යටතේ ආදායම් ඇස්තමේන්තු කිරීම, එකතු කිරීම හා ගිණුම්ගත කිරීම.
- විදේශ ආධාර ණය සහ ප්‍රදාන යටතේ ලැබෙන මුදල් අදාල ව්‍යාපෘති වෙත නිකුත් කිරීම සඳහා පහසුකම් සැලසීම.
- විදේශ ආධාර ගිණුම් තැබීමේ ක්‍රියාවලිය සඳහා පහසුකම් සැලසීම.
- රාජ්‍ය ණය ගැනීම් හා ණය සේවා ගිණුම්ගත කිරීම.
- රජයේ බැංකු ගිණුම් සහ අග්‍රිම ගිණුම් ආරම්භ කිරීම/පවත්වාගෙන යාම සඳහා බලය දීම හා අධීක්ෂණය කිරීම.
- රාජ්‍ය නිලධාරීන්ගේ දේපල ණය ඇප යෝජනා ක්‍රමය මෙහෙය වීම.

# 3. සංවිධාන ව්‍යූහය



අධ්‍යක්ෂ ජනරාල්
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (රාජ්‍ය ණය කළමනාකරණ හා ප්‍රතිසංස්කරණ)
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ඒකාබද්ධ අරමුදල් කළමනාකරණ, පාලන හා ගිණුම්)
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (මුදල් ප්‍රවාහ කළමනාකරණ හා ආදායම්)
අධ්‍යක්ෂ (විදේශ ණය 1)
අධ්‍යක්ෂ (විදේශ ණය 2)
අධ්‍යක්ෂ (දේශීය ණය)
අධ්‍යක්ෂ (රාජ්‍ය ණය හා ප්‍රතිසංස්කරණ)
අධ්‍යක්ෂ (ඒකාබද්ධ අරමුදල් කළමනාකරණ)
අධ්‍යක්ෂ (අරමුදල් මෙහෙයුම් හා ගිණුම්)
අධ්‍යක්ෂ (ආදායම්)
අධ්‍යක්ෂ (මුදල් ප්‍රවාහ කළමනාකරණ)
අධ්‍යක්ෂ (උප ණය)
නි.අ./ස.අ. (විදේශ ණය ආධාර)
නි.අ./ස.අ. (ITMIS)
නි.අ./ස.අ. (අයවැය ක්‍රියාත්මක කිරීම 1)
නි.අ./ස.අ. (අයවැය ක්‍රියාත්මක කිරීම 2)
නි.අ./ස.අ. (අයවැය ක්‍රියාත්මක කිරීම 3)
නි.අ./ස.අ. (අයවැය ක්‍රියාත්මක කිරීම 4)
නි.අ./ස.අ. (ඒකාබද්ධ අරමුදල් සැසඳුම්)
නි.අ./ස.අ. (පාලන)
නි.අ./ස.අ. (සැපයුම් හා ගිණුම්)
නි.අ./ස.අ. (ආදායම්)
නි.අ./ස.අ. (මුදල් ප්‍රවාහ කළමනාකරණ)
පරිපාලන නිලධාරි

# 4. සේවක සංඛ්‍යා තොරතුරු

වගුව **4. 1 :** 2018.12.31 දිනට සේවක සංඛ්‍යා තොරතුරු

| තනතුර | අනුමත කාර්ය මණ්ඩලය | දැනට සිටින කාර්ය මණ්ඩලය |
|---|---|---|
| අධ්‍යක්ෂ ජනරාල් | 01 | 01 |
| අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | 03 | 03* |
| ශ්‍රී.ලං.ග.සේ. I පන්තිය | 09 | 08 |
| ශ්‍රී.ලං.ග.සේ. II / III පන්තිය | 10 | 08 |
| ශ්‍රී.ලං.ප.සේ. II / III | 01 | - |
| පරිපාලන නිලධාරී | 01 | 01 |
| සංවර්ධන නිලධාරි | 22 | 20** |
| රා.ක.ස. I /II/ III පන්තිය | 55 | 54 |
| තොරතුරු හා සංනිවේදන තාක්ෂණ සහකාර | 01 | 01 |
| රියදුරු | 08 | 08 |
| කා.කා.සේ. I /II/ III පන්තිය | 12 | 11 |
| එකතුව | 123 | 115 |

* ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් තිදෙනෙකු පූර්ණ කාලීන පදනම මත අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුරුවල වැඩ බැලීම සිදු කරයි.

** සංවර්ධන නිලධාරි අනුමත තනතුරු තුළ 2018.08.03 දින සිට අභ්‍යාසලාභී උපාධිධාරිනියක් ඇතුළත් කර ඇත.

# 5. මානව සම්පත් සංවර්ධනය

දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයේ නිළධාරීන්ගේ දැනුම කුසලතා හා ආකල්ප අඛණ්ඩව වැඩිදියුණු කිරීම සඳහා විවිධ ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සහ පහත දැක්වෙන පරිදි නිළධාරීන් සහභාගී කරවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලදී.

5. 1 දේශීය පුහුණු පාඨමාලා - 2018

වගුව **5.1**

| **නිළධාරී ගණය** | **පුහුණු පාඨමාලා ගණන** | **පුහුණු වූ නිළධාරීන් ගණන** | **පුහුණුව ලැබූ ක්ෂේත්‍රය** | **ආයතනය/ ස්ථානය** |
|---|---|---|---|---|
| මාණ්ඩලික නිළධාරීන් | 05 | 01 | වෘත්තිමය ඉංග්‍රීසි ඩිප්ලෝමාව | මිලෝදා |
| | | 01 | රාජ්‍ය සේවයේ නිවැරදි සංවිධානාත්මක සංස්කෘතිය සංවර්ධනය කිරීම පිළිබඳ දේශනය | ශ්‍රී ලංකා පදනම් ආයතනය |
| | | 02 | පුද්ගලික හවුල් ව්‍යපාර පිළිබඳ වැඩමුළුව | හිල්ටන් |
| | | 01 | රාජ්‍ය ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමාව | මිලෝදා |
| | | 01 | පෞද්ගලික ලිපි ගොනු කළමනාකරණය | මිලෝදා |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 07 | 02 | රැකියා සඳහා ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලාව | මිලෝදා |
| | | 02 | උසස් එක්සෙල් පාඨමාලාව | මිලෝදා |
| | | 01 | සිගාස් පාඨමාලාව | මිලෝදා |
| | | 02 | රජයේ විගණන ප්‍රමිති සහ විමසුම් වලට පිළිතුරු ලිවීම. | මිලෝදා |
| | | 01 | රාජ්‍ය ප්‍රසම්පාදන කළමණාකරණය | මිලෝදා |
| | | 03 | කණිෂ්ඨ නිලධාරීන් සඳහා එක්සෙල් නිපුණතා පිළිබඳ උසස් පාඨමාලාව | මිලෝදා |
| | | 01 | නිවාඩු භාර නිලධාරියාගේ කාර්යභාරය හා වගකීම | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය |

| | | | | |
|---|---|---|---|---|
| සංවර්ධන නිලධාරින් | 05 | 01 | කණිෂ්ඨ විධායක නිලධාරීන් සඳහා ඉංග්‍රීසි ඩිප්ලෝමාව | මිලෝදා |
| | | 01 | උසස් එක්සෙල් පාඨමාලාව | මිලෝදා |
| | | 01 | රජයේ විගණන ප්‍රමිති සහ විමසුම් වලට පිළිතුරු ලිවීම. | මිලෝදා |
| | | 02 | ලිපිගොනු කළමනාකරණය, සාමාන්‍ය කාර්යාල පරිපාලනය සහ ආයතන සංග්‍රහය | මිලෝදා |
| | | 01 | කණිෂ්ඨ නිලධාරීන් සඳහා එක්සෙල් නිපුණතා පිළිබඳ උසස් පාඨමාලාව | මිලෝදා |
| කාර්ය මණ්ඩලයේ සියළුම නිලධාරින් | 01 | 100 | කාර්ය මණ්ඩල නිලධාරින් දැනුවත් කිරීමේ පුහුණු පාඨමාලාව | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව |

ඉහත පුහුණු වැඩසටහන්වලට අමතරව 2018 නොවැම්බර් මස 10 සහ 11 දෙදින නැගෙනහිර පළාත් පුහුණු ආයතනය - ත්‍රිකුණාමලය හි දී කාර්ය මණ්ඩලයේ සියළු දෙනාගේ සහභාගිත්වයෙන් ආකල්ප හා කුසලතා සංවර්ධනය සඳහා දෙදින වැඩමුළුවක් පවත්වන ලදී. මෙවැනි වැඩසටහන් සංවිධානය කිරීම මගින් කාර්ය මණ්ඩලයේ නිලධාරින්ගේ පුද්ගලාභිවර්ධනය හා අන්‍යොන්‍ය සම්බන්ධතා වැඩිදියුණු කිරීම සඳහා මහත් පිටුවහලක් ලබා ගතහැකි විය. මේ සඳහා දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය 100 දෙනෙකු ක්‍රියාකාරි ලෙස සහභාගි විය.

## 5. 2 විදේශීය පුහුණු පාඨමාලා සහ සමුළු සඳහා සහභාගීත්වය - 2018

වගුව **5.2**

| | පුහුණුව / සම්මන්ත්‍රණය හෝ සමුළුව | රට | සේවා ගණය | කාල සීමාව | සහභාගී වූ නිළධාරීන් ගණන |
|---|---|---|---|---|---|
| 01 | ශ්‍රී ලංකා රජයේ නිලධාරීන් සඳහා ක්‍රෙඩිට් සංසදයේ මාර්ගෝපදේශ වැඩමුළුව | ඉන්දියාව | මාණ්ඩලික නිලධාරී | 2018.01.11<br>2018.01.12 | 01 |
| 02 | හවුල්කාරත්ව සහ කුසලතා සංවර්ධනය සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීමේ පාඨමාලාව | ඉන්දියාව | සංවර්ධන නිලධාරී | 2018.01.22<br>2018.03.16 | 01 |
| 03 | තිරසාර ඉ-රාජ්‍ය විසඳුම් ක්‍රියාත්මක කිරීමේ වැඩමුළුව | සිංගප්පූරුව | මාණ්ඩලික නිලධාරී | 2018.02.26<br>2018.03.02 | 08 |
| 04 | ෆ්‍රී බැලන්ස් ජාත්‍යන්තර මෙහෙයුම් කමිටුව | ඇ.එ.ජ. | මාණ්ඩලික නිලධාරී | 2018.03.14<br>2018.03.18 | 01 |
| 05 | ණය කළමනාකරණ කාර්ය සාධනය තක්සේරු කිරීමේ වැඩමුළුව | මලයාසියාව | මාණ්ඩලික නිලධාරී | 2018.03.19<br>2018.03.23 | 02 |
| 06 | මූල්‍ය කළමණාකරණ උපාය මාර්ග ජාත්‍යන්තර නිරාවරණය පිළිබඳ පුහුණු වැඩසටහන | තායිලන්තය | මාණ්ඩලික නිලධාරී<br>සංවර්ධන නිලධාරී<br>තො.සං.තා. නිලධාරී | 2018.04.29<br>2018.05.06 | 07<br>01<br>01 |
| 07 | රාජ්‍ය ණය කළමනාකරණය | තායිලන්තය | මාණ්ඩලික නිලධාරී | 2018.05.07<br>2018.05.12 | 01 |
| 08 | 2018 සංවර්ධනය වන රටවල මූල්‍ය ක්‍රමෝපාය පිළිබඳ අමාත්‍ය වරුන්ගේ වැඩමුළුව | චීනය | මාණ්ඩලික නිලධාරී | 2018.06.11<br>2018.06.17 | 01 |
| 09 | සංවර්ධනය වන රටවල් සඳහා බැංකු හා මුදල් කළමනාකරණය පිළිබඳ 2018 සම්මන්ත්‍රණය | චීනය | මාණ්ඩලික නිලධාරී | 2018.07.04<br>2018.07.24 | 01 |
| 10 | වෙළඳ හා තිරසාර බව පිළිබඳ පුහුණු වැඩමුළුව | ඉන්දියාව | සංවර්ධන නිලධාරී | 2018.07.09<br>2018.07.20 | 01 |
| 11 | රජයේ ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමාවේ විදේශ සංචාරය | ජපානය | මාණ්ඩලික නිලධාරී | 2018.09.09<br>2018.09.19 | 01 |
| 12 | ඉදිකිරීම් හා කාර්මික උද්‍යාන කළමනාකරණය පිළිබඳ සම්මන්ත්‍රණය | චීනය | මාණ්ඩලික නිලධාරී | 2018.09.24<br>2018.10.16 | 01 |
| 13 | සංවර්ධිත රටවල්වල ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සඳහා වෙළඳ ආධාර පිළිබඳ සම්මන්ත්‍රණය | චීනය | මාණ්ඩලික නිලධාරී<br>සංවර්ධන නිලධාරී | 2018.10.16<br>2018.10.29 | 01<br>01 |
| 14 | බාහිර සමතුලිතතාවය පිළිබඳ වැඩමුළුව | ඉන්දියාව | මාණ්ඩලික නිලධාරී | 2018.12.10<br>2018.12.12 | 01 |

# 6. චක්‍රලේඛ හා උපදෙස්

රාජ්‍ය අරමුදල් කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා 2018 වර්ෂය තුළදී දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් පරිදි චක්‍රලේඛ නිකුත් කරමින් උපදෙස් හා මඟ පෙන්වීම් ලබා දී ඇත.

වගුව **6.1**

| දිනය | චක්‍රලේඛ අංකය | විෂයය |
|---|---|---|
| 2018.05.14 | 01/2018 | 2019 වර්ෂය සඳහා ආදායම් ඇස්තමේන්තු |
| 2018.05.24 | 02/2018 | 2018.06.30 දිනට හිඟ ආදායම් වාර්තා ඉදිරිපත් කිරීම |
| 2018.06.12 | 3/2017(i) | 2018 ජූනි මස 15 දිනට යෙදෙන රාමසාන් උත්සවය වෙනුවෙන් ඉස්ලාම් බැතිමතුන්ට 2018 ජූනි මස වැටුප කලින් ගෙවීම |
| 2018.07.26 | 03/2018 | අක්‍රිය නිල බැංකු ගිණුම් වසා දැමීම |
| 2018.09.06 | 04/2018 | 2019 වර්ෂය තුළදී වැටුප්, වැටුප් අත්තිකාරම් සහ විශ්‍රාම වැටුප් ගෙවීම |
| 2018.09.14 | 05/2018 | භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් ආදායම් ගණන්දීමේ නිලධාරියා ලෙස කටයුතු කරන ආදායම් සංකේතාංක යටතේ එකතුවන ආදයම් රැස්කිරීම, පරිපාලනය, අධීක්ෂණය හා වාර්තා තබා ගැනීම |
| 2018.11.05 | 06/2018 | 2018 වසර සඳහා මුදල් පොත් පියවීම සහ අග්‍රිම ගිණුම් පියවීම. |
| 2018.11.28 | 07/2018 | 2018.12.31 දිනට හිඟ ආදායම් වාර්තා ඉදිරිපත් කිරීම |
| 2018.12.19 | 03/2017(ii) | 2018 දෙසැම්බර් මස 25 දිනට යෙදෙන නත්තල් උත්සවය වෙනුවෙන් කිතුනු බැතිමතුන්ට 2018 දෙසැම්බර් මස වැටුප කලින් ගෙවීම |

# 7. මූල්‍ය කාර්යසාධනය - 2018

වගුව 7.1

| | | | | | | රුපියල් දහස් ගණනින් |
|---|---|---|---|---|---|---|
| වැය විෂය | කාණ්ඩය / වැය විෂය / අයිතමය / විස්තරය | 2017 | | 2018 | | 2017 තත්‍ය වියදමට අනුව |
| | | ඇස්තමේන්තුව | තත්‍ය | ඇස්තමේන්තුව | තත්‍ය | 2018 වියදමේ වැඩි වීම / (අඩු වීම) | එහි ප්‍රතිශතය (%) |
| | **පුනරාවර්තන වියදම්** | **963,736** | **926,838** | **1,285,985** | **1,120,718** | **164,579** | **17.76** |
| | **පුද්ගල පඩිනඩි** | **75,650** | **67,104** | **73,610** | **72,785** | **5,681** | **8.47** |
| 1001 | වැටුප් හා වේතන | 41,000 | 38,593 | 45,700 | 45,561 | 6,968 | 18.06 |
| 1002 | අතිකාල සහ නිවාඩු දින වැටුප් | 650 | 640 | 950 | 927 | 287 | 44.84 |
| 1003 | වෙනත් දීමනා | 34,000 | 27,871 | 26,960 | 26,297 | (1,574) | (5.65) |
| | **ගමන් වියදම්** | **3,330** | **3,089** | **1,615** | **674** | **(2,415)** | **(78.18)** |
| 1101 | දේශීය | 130 | 129 | 215 | 204 | 75 | 58.14 |
| 1102 | විදේශීය | 3,200 | 2,960 | 1,400 | 470 | (2,490) | (84.12) |
| | **සැපයීම්** | **4,250** | **4,172** | **5,300** | **5,198** | **1,026** | **24.59** |
| 1201 | ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 2,200 | 2,174 | 2,500 | 2,497 | 323 | 14.86 |
| 1202 | ඉන්ධන | 1,970 | 1,919 | 2,700 | 2,602 | 683 | 35.59 |
| 1203 | ආහාරපාන හා නිල ඇඳුම් | 80 | 79 | 100 | 99 | 20 | 25.32 |
| | **නඩත්තු වියදම්** | **3,220** | **2,285** | **3,531** | **3,502** | **1,217** | **53.26** |
| 1301 | වාහන | 2,400 | 1,926 | 2,881 | 2,858 | 932 | 48.39 |
| 1302 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 500 | 285 | 500 | 498 | 213 | 74.74 |
| 1303 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 320 | 74 | 150 | 146 | 72 | 97.30 |
| | **සේවා** | **4,790** | **3,671** | **4,579** | **4,509** | **838** | **22.83** |
| 1401 | ප්‍රවාහන | 2,400 | 1,863 | 2,400 | 2,399 | 536 | 28.77 |
| 1402 | තැපැල් සහ සන්නිවේදන | 2,200 | 1,626 | 2,019 | 1,952 | 326 | 20.05 |
| 1405 | වෙනත් | 190 | 182 | 160 | 158 | (24) | (13.19) |
| | **මාරු කිරීම්** | **866,676** | **840,697** | **1,162,228** | **998,929** | **158,232** | **18.82** |
| 1503-01 | ලොතරැයි ආදායම් ආපසු ගෙවීම් | 365,676 | 339,747 | 460,978 | 297,686 | (42,061) | (12.38) |
| 1505-01 | රාජ්‍ය සේවක රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා රජයේ දායකත්වය | 500,000 | 500,000 | 700,000 | 700,000 | 200,000 | 40.00 |
| 1506 | රජයේ සේවකයින් සඳහා දේපල ණය පොළී | 1,000 | 950 | 1,250 | 1,243 | 293 | 30.84 |
| | **වෙනත් පුනරාවර්තන වියදම්** | **5,820** | **5,820** | **35,122** | **35,121** | **29,301** | **503.45** |
| 1701 | පාඩු හා කපා හැරීම් | 5,820 | 5,820 | 35,122 | 35,121 | 29,301 | 503.45 |

| | | | | | | රුපියල් දහස් ගණනින් | |
|---|---|---|---|---|---|---|---|
| වැය විෂය | කාණ්ඩය / වැය විෂය /අයිතමය / විස්තරය | 2017 | | 2018 | | 2017 තත්‍ය වියදමට අනුව | |
| | | ඇස්තමේන්තුව | තත්‍ය | ඇස්තමේන්තුව | තත්‍ය | 2018 වියදමේ වැඩි වීම / (අඩු වීම ) | එහි ප්‍රතිශතය (%) |
| | **මූලධන වියදම්** | **9,500** | **3,598** | **7,400** | **6,453** | **2,855** | **79.35** |
| | **මූලධන වත්කම් වල පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම** | **2,700** | **1,456** | **2,900** | **2,749** | **1,293** | **88.80** |
| 2001 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 100 | - | 1,100 | 1,090 | 1,090 | 100 |
| 2002 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | | | | | | |
| 2002-1 | භාණ්ඩාගාර කේවල ගිණුම් ක්‍රම ක්‍රියාත්මක කිරීම | 1,500 | 981 | 1,000 | 981 | - | - |
| 2002-2 | වෙනත් | 100 | 41 | 100 | - | (41) | (100.00) |
| 2003 | වාහන | 1,000 | 434 | 700 | 678 | 244 | 56.22 |
| | **මූලධන වත්කම් අත්පත් කර ගැනීම** | **5,000** | **377** | **1,000** | **801** | **424** | **112.47** |
| 2102 | ගෘහභාණ්ඩ හා කායර්ාලයීය උපකරණ | 5,000 | 377 | 1,000 | 801 | 424 | 112.47 |
| | **හැකියා වර්ධනය** | **1,800** | **1,765** | **3,500** | **2,903** | **1,138** | **64.48** |
| 2401 | කායර් මණ්ඩල පුහුණු | 1,800 | 1,765 | 3,500 | 2,903 | 1,138 | 64.48 |

# 8.භෞතික කාර්ය සාධනය

## 8.1 මුදල් කළමනාකරණය

### 8.1.1 භාණ්ඩාගාර මුදල් ප්‍රවාහ කළමනාකරණය

රාජ්‍ය මුදල් ප්‍රවාහ කළමනාකරණයේ මූලික පදනම ලෙස සැලකෙනුයේ වාර්ෂික ඇස්තමේන්තු තුලින් රජයේ ප්‍රතිපත්තිමය උපායමාර්ග ක්‍රියාත්මක කිරීම පිළිබිඹු වීමයි. මෙමඟින් රාජ්‍ය ප්‍රතිපත්ති සහ උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම උදෙසා මහජන සේවාවන් පවත්වා ගැනීම වෙනුවෙන් පුනරාවර්ථන ස්වභාවයේ වියදම් දැරීමටත්, ප්‍රාග්ධන ස්වභාවයේ රාජ්‍ය ආයෝජන වෙනුවෙන් වූ වියදම් වැඩසටහන් සඳහාත් ප්‍රතිපාදන වෙන්කිරීම සිදුකරනු ලබයි. මෙම ප්‍රයත්නයේදී භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව, සිය මුදල් කළමනාකරණ ක්‍රියාවලියේ අංගයක් ලෙස අමාත්‍යාංශ දෙපාර්තමේන්තු හා අනෙකුත් ආයතන ඇතුළත්ව ඒ ඒ වියදම් ඒකක සඳහා ඵලදායී සහ කාර්යක්ෂම ලෙස අක්මුදල් නිදහස් කිරීමේ කාර්ය භාරය සහතික කරයි.

ඵලදායී සහ කාර්යක්ෂම ලෙස අයවැය ඉලක්ක ඉටුකර ගැනීම සඳහා සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළදී භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව, නිසි වේලාවට හා ප්‍රමුඛතාව පදනම් කරගනිමින් මූල්‍ය පිරිවැය අවම කිරීම කෙරෙහි අවධානය යොමුකරමින් රජයේ මුදල් ප්‍රවාහ කළමනාකරණ ක්‍රියාකාරකම් සිදුකරන ලදී. වසර තුළදී සමහර ප්‍රධාන ආදායම් ප්‍රභවයන්ගෙන් අපේක්ෂිත ආදායම් නොලැබීම නිසා ද, ආදායම් ලැබීමේ රටාවන්හි යම් යම් වෙනස්කම් නිසා ද, අයවැය ක්‍රියාත්මක කරන ආයතනවල මූල්‍ය අවශ්‍යතා සපුරාලීමේ දී ප්‍රායෝගික අපහසුතාවයන්ට මුහුණපෑමට ද මෙම දෙපාර්තමේන්තුවට සිදුවිය.

පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද 2017 අංක 30 දරණ විසර්ජන පනත පදනම්ව ප්‍රධාන ආදායම් එකතුකිරීමේ ආයතනවලින් සහ වියදම් ඒකකයන්ගෙන් එකතුකර ගන්නා ලද තොරතුරු වලට අනුරූපව, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් 2018 වර්ෂය සඳහා මාසික හා වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශන පිළියෙල කරන ලදී. රජයට අවම පිරිවැයක් යටතේ වඩාත් උචිත ලෙස ණය ලබාගැනීම තහවුරු කර ගැනීම පිණිස වාර්ෂික අයවැය ලේඛනයේ ණය සීමාව පදනම් කරගෙන රජයේ ණය ලබා ගැනීමේ වැඩසටහනද පිළියෙල කරන ලදී. රජය විසින් ණය උපකරණ නිකුත් කිරීමේ දී එහි විනිවිදභාවය තවදුරටත් වැඩිදියුණු කිරීමේ පියවරක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් ආරම්භ කරන ලද රජයේ ණය ලබාගැනීමේ දින දර්ශනය ප්‍රසිද්ධ කිරීමේ අවශ්‍යතාවය සපුරාලීම සඳහා මෙම දෙපාර්තමේන්තුව විසින් ණය ලබා ගැනීමේ දින දර්ශනය ඉදිරි කාර්තුව සඳහා ද පිළියෙළ කිරීම ආරම්භ කරන ලදී.

වගුව 8.1:  භාණ්ඩාගාර මුදල් ප්‍රවාහ කළමනාකරණ ප්‍රකාශණය- 2018

**රුපියල් බිලියන**

| **අයිතමය** | **2017** | **2018** | |
|---|---|---|---|
| | තත්‍ය | ඇස් තමේන්තුගත | තත්‍ය |
| ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය | (160.3) | (186.2) | (186.2) |
| ආදායම් සහ අනෙකුත් ලැබීම් ඇතුළත්ව මුළු මුදල් ලැබීම් | 1,765.3 | 2,144.9 | 1,870.2 |
| පුනරාවර්තන වියදම් සඳහා මුළු මුදල් ගලායාම | (1,853.6) | (2,102.2) | (2,000.7) |
| ප්‍රාග්ධන වියදම් සඳහා මුළු මුදල් ගලායාම * | (646.1) | (819.9) | (594.0) |
| ශුද්ධ මුදල් අතිරික්තය / (හිඟය) | (734.4) | (777.2) | (724.5) |
| දළ ණය ගැනීම් * | 1,564.5 | 1,927.2 | 1,853.9 |
| ණය ආපසු ගෙවීම් | (868.9) | (1,150.0) | (1,232.3) |
| ශුද්ධ ණය ගැනීම් | 695.6 | 777.2 | 621.6 |
| ගැලපීම් ගිණුමේ ශේෂය (TEB, net deposits, etc.) | 12.9 | - | 14.9 |
| දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය | (186.2) | (186.2) | (274.2) |

මූලාශ්‍ර : භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව

*විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට CSDRMS වාර්තාවේ ඇතුලත් වන ව්‍යාපෘති ණය ඇතුලත් වේ.

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ ආදායම් හා අනෙකුත් ලැබීම් ඇතුළත්ව භාණ්ඩාගාර මුදල් ලැබීම් රුපියල් බිලියන 1,870.2ක් වූ අතර පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් රුපියල් බිලියන 2,594.7ක් දක්වා ඉහළ යාම ශුද්ධ මුදල් හිඟය රුපියල් බිලියන 724.5 ක් වීමට හේතු විය. ඒ අනුව, 2017 වර්ෂයට සාපේක්ෂව සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළදී ශුද්ධ මුදල් හිඟය රුපියල් බිලියන 9.9 කින් අඩුවීමක් පෙන්නුම් කරයි. ප්‍රාග්ධන වියදම් සඳහා මුදල් ගලායාම 8.1 ප්‍රතිශතයකින් අඩු වීම සහ ආදායමේ වැඩිවීම මෙම ශුද්ධ මුදල් හිඟය අඩුවීමට හේතු සාධකය වශයෙන් දැක්විය හැක. තවද, රුපියල් බිලියන 186.2 ක් වූ 2017 දෙසැම්බර් 31 දිනට වූ සමස්ත මුදල් ශේෂය (හිඟය) 2018 දෙසැම්බර් 31 දිනට රුපියල් බිලියන 274.2 දක්වා ඉහළ යාමක් පෙන්නුම් කරන ලද අතර මෙයට ප්‍රධාන හේතුව ලෙස ණය ආපසු ගෙවීම් 2017 වසරේදී රුපියල් බිලියන 868.9 සිට රුපියල් බිලියන 1,232.3 දක්වා ඉහළ යාම දැක්විය හැක.

### 8.1.1.1 භාණ්ඩාගාර මුදල් ලැබීම්

බදු ආදායම්, බදු නොවන ආදායම් හා විදේශ ප්‍රදාන යන භාණ්ඩාගාර ප්‍රධාන ලැබීම් මූලාශ්‍ර තුන මඟින් 2018 වර්ෂයේ මහා භාණ්ඩාගාරය රුපියල් බිලියන 1870.2 ක් ලැබීම් ලෙස වාර්තා කරන ලදී. පසුගිය වසර හා සැසඳීමේ දී එකී රාජ්‍ය ආදායම සියයට 5.9 ක වර්ධනයක් පෙන්නුම් කරන ලදී. 2018 වර්ෂයේ දී ඇස්තමේන්තුගත වාර්ෂික ආදායමෙන් සියයට 87.2ක් රැස්කිරීමට හැකි වී ඇති අතර, එම ආදායමෙන් සියයට 90.1 ක් බදු ආදායම් වේ. 8.2 වගුව මගින් නිරූපනය වන පරිදි 2014-2018 දක්වා පසුගිය වසර 5ක කාල පරිච්ඡේදය තුළ රුපියල් බිලියන 987.7 සිට රුපියල් බිලියන 1685.3 දක්වා සියයට 70.6 කින් බදු ආදායම වර්ධනය වීමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කර ඇත. ශ්‍රී ලංකාව මධ්‍යම ආදායම් ලබන රටක් බවට ශ්‍රේණිගත කිරීමත් සමඟ 2015 වසරේ දී විදේශ ආධාර ප්‍රදාන ලැබීමේ ප්‍රවණතාව අඩු වූ නමුත් 2017 වර්ෂය තුළ රටට මුහුණ පෑමට සිදු වූ ස්වභාවික විපත් ගණනාවක් හේතු කොටගෙන ආපදා සහන වශයෙන් එම කාල සීමාව තුළ විදේශ ආධාර ප්‍රදාන ලැබීමේ වැඩිවීමක් පෙන්නුම්කරන ලදී. 2018 වර්ෂය තුළදී ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලද මුදල වන රුපියල් බිලියන 107.0 ක මුදලින් රුපියල් බිලියන 43.8 මුදලක් වර්ෂය තුළදී භාවිතා කරන ලදී.


වගුව 8.2: ආදායම් එකතු කිරීම් 2014 සිට 2018 දක්වා

රුපියල් බිලියන

| | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|
| බදු ආදායම් | 987.7 | 1,270.1 | 1,446.4 | 1,645.3 | 1,685.3 |
| බදු නොවන ආදායම් | 97.2 | 63.0 | 168.3 | 117.4 | 139.1 |
| විදේශ ප්‍රදාන | 2.5 | 1.5 | 1.5 | 2.6 | 2.0 |
| හම්බන්තොට ලැබීම් පාරිභෝජනය | | | | | 43.8 |
| එකතුව | 1,087.4 | 1,334.6 | 1,616.2 | 1,765.3 | 1,870.2 |

මූලාශ්‍ර : භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව (මුදල් කළමනාකරණ)

රූප සටහන 8.1:   ආදායම් එකතු කිරීම් 2014 සිට 2018 දක්වා




## 8.1.1.2 භාණ්ඩාගාර මුදල් ගලායාම

2018 වසරේ මුළු මුදල් ගලායාම 8.3 වගුවෙහි දැක්වෙන පරිදි, භාණ්ඩාගාරය මඟින් වියදම් ඒකක වෙත මුදල් නිදහස් කිරීම් 2017 වර්ෂයට සාපේක්ෂව 2018 වර්ෂය තුලදී පුනරාවර්තන වියදම් සඳහා මුදල් නිදහස් කිරීම් සියයට 3.8 කින් වැඩි වූ අතර, ප්‍රාග්ධන වියදම් සඳහා මුදල් නිදහස් කිරීම සියයට 1.9 කින් අඩුවීමක් පෙන්නුම් කර ඇත. සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ මුළු නිදහස් කිරීම සළකා බැලීමේ දී  මුළු වියදමින් සියයට 59.2 ක ප්‍රමාණයක් මුදල් නිදහස් කර ඇත්තේ රාජ්‍ය අංශයේ වැටුප් ගෙවීම, සමෘද්ධි දීමනා, විශ්‍රාම වැටුප් හා වකුගඩු රෝගීන්ට ආධාර කිරීම වැනි අනෙකුත් සමාජ සුභසාධක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා වේ.

වගුව 8.3: භාණ්ඩාගාර මුදල් ගලායාම පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් /ආයතන වශයෙන් 2015 සිට 2018

රුපියල් බිලියන

| ආයතනය | 2015 | | 2016 | | 2017 | | 2018 | |
|---|---|---|---|---|---|---|---|---|
| | පුනරාවර්තන | ප්‍රාග්ධන | පුනරාවර්තන | ප්‍රාග්ධන | පුනරාවර්තන | ප්‍රාග්ධන | පුනරාවර්තන | ප්‍රාග්ධන |
| විශේෂ වියදම් ඒකක | 10.2 | 1.7 | 7.2 | 2.6 | 9.3 | 3.3 | 11.8 | 2.9 |
| අමාත්‍යාංශ | 234.7 | 173.4 | 224.1 | 185.7 | 239.3 | 230.5 | 242.6 | 219.2 |
| දෙපාර්තමේන්තු | 579.3 | 72.0 | 594.8 | 64.5 | 611.7 | 81.0 | 625.9 | 76.0 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාල | 40.2 | 44.0 | 44.5 | 49.7 | 50.1 | 47.3 | 48.4 | 57.5 |
| පළාත් සභා | 167.5 | 21.7 | 169.0 | 15.7 | 165.5 | 23.8 | 180.2 | 16.0 |
| විශ්වවිද්‍යාල | 26.8 | 9.6 | 29.1 | 22.0 | 31.1 | 17.5 | 37.2 | 21.0 |
| වෙනත් (සංස්ථා මණ්ඩල) | 21.1 | 19.5 | 23.3 | 14.3 | 24.4 | 11.8 | 28.6 | 14.5 |
| එකතුව | 1079.6 | 341.8 | 1092.1 | 354.4 | 1131.3 | 415.0 | 1174.6 | 407.1 |

මූලාශ්‍ර : භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව (ඒකාබද්ධ අරමුදල් කළමනාකරණ)

## 8.2. රාජ්‍ය ණය කළමනාකරණය

### 8.2.1 රාජ්‍ය ණය වැඩසටහන – 2018

2017 අංක 30 දරණ විසර්ජන පනත මඟින් පාර්ලිමේන්තුව විසින් 2018 වර්ෂය සඳහා ණය ගැනීමේ සීමාව ලෙස රුපියල් බිලියන 1,893 ක් අනුමත කර ඇත.

සත්‍ය ණය ගැනීම් ප්‍රමාණය රු. බිලියන 1,881 ක් වූ අතර ඒ සඳහා දේශීය මූලාශ්‍ර වලින් රුපියල් බිලියන 1,109 ක් සහ විදේශීය මූලාශ්‍ර වලින් රුපියල් බිලියන 772 ක ප්‍රමාණයක් සපයා ගනු ලැබීය. විදේශීය මූලාශ්‍ර වලින් ණය ලබා ගැනීම් තුළ විදේශ වෙළඳපල වෙත නිකුත් කරන ලද ජාත්‍යාන්තර ස්වෛරීත්ව බැඳුම්කර මඟින් ලබාගත් රුපියල් බිලියන 391 ක්ද , විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම මඟින් ලබාගත් රුපියල් බිලියන 171 ක්ද සංවර්ධන ප්‍රතිපත්ති, ව්‍යාපෘති හා වැඩසටහන් ණය සඳහා ලද රුපියල් බිලියන 210 ක්ද අඩංගු විය. 2018 වර්ෂයේ රුපියල් බිලියන 1,881 ක දළ ණය ගැනීම් ප්‍රමාණය 2017 වර්ෂයේ රුපියල් බිලියන 1,620 ක්වූ එම ප්‍රමාණයට සාපේක්ෂව සියයට 16 ක වැඩි වීමක් සටහන් කරයි.

2018 වර්ෂයේ රුපියල් බිලියන 1,109 ක මුළු දේශීය ණය ගැනීම් ප්‍රමාණය 2017 හි රුපියල් බිලියන 1,018 ක් වූ එම ප්‍රමාණයට සාපේක්ෂව සියයට 9 ක වැඩිවීමක් පෙන්නුම් කරයි. ණය ආපසු ගෙවීම සඳහා භාණ්ඩාගාර බැඳුම්කර සහ විදේශ විනිමය බැංකු ඒකක මඟින් ලබාගත් ණය මුදල් මේ සඳහා ප්‍රධාන වශයෙන් දායක වී ඇත.

වගුව 8.4 : ණය ගැනීම් සඳහා අනුමත සීමා සහ එම සීමා භාවිතය

(රු.මිලියන)

| අයිතමය | 2017 | | 2018 | |
|---|---|---|---|---|
| | අනුමත සීමා | භාවිතය | අනුමත සීමා | භාවිතය |
| **දළ ණය ගැනීම්** | **1,629,000** | **1,619,625** | **1,893,844** | **1,880,706** |
| දේශීය | 1,179,000 | 1,018,320 | 1,313,844 | 1,109,098 |
| විදේශීය | 450,000 | 601,305 | 580,000 | 771,608 |
| **සමස්ථ මූල්‍යනය** | **1,629,000** | **1,619,625** | **1,893,844** | **1,880,706** |

*මූලාශ්‍ර : භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව*


## 8.2.2 දේශීය මූල්‍යකරණය

### 8.2.2.1 නොපියවූ දේශීය ණය

2018 වර්ෂයේ අවසානයට රජයේ මුළු දේශීය ණය සඳහා භාණ්ඩාගාර බැඳුම්කර, භාණ්ඩාගාර බිල්පත් හා ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල දායකත්වය පිළිවෙලින් සියයට 69.9 ක්, සියයට 12.2 ක් සහ සියයට 9.9 ක් විය. ඉතිරිය ශ්‍රී ලංකා මහ බැංකුව මඟින් ලබාගත් තාවකාලික අත්තිකාරම් (සියයට 3.2), රුපියල් ණය (සියයට 0.4) විදේශ ව්‍යවහාර බැංකු ඒකක මගින් ලබාගත් ණය (සියයට 1.9) හා වෙනත් ණය (සියයට 2.5) මඟින් සමන්විත වේ.

2018 දී භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රමාණය පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 2.6 ක වැඩිවීමක් පෙන්නුම් කරන අතර 2017 වර්ෂයේදී සියයට 12.1 ක් වූ භාණ්ඩාගාර බිල්පත් දායකත්වය 2018 වර්ෂයේදී සියයට 12.2 දක්වා වැඩි වී ඇත. තවද නොපිය වූ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 0.4ක සුළු අඩුවීමක් පෙන්නුම් කරයි.

රූප සටහන 8.2: දේශීය ණය සංයුතිය




## 8.2.2.2 දේශීය ණය සේවා ගෙවීම්

2018 වර්ෂයේ රුපියල් බිලියන 1,597 ක රජයේ දේශීය ණය සේවා ගෙවීම්, 2017 වර්ෂයේ රුපියල් බිලියන 1,245 ක් වූ ප්‍රමාණයට සාපේක්ෂව සියයට 28 ක වැඩිවීමක් පෙන්නුම් කරයි. මුළු ණය සේවා ගෙවීම් වලින් රුපියල් බිලියන 929 ( සියයට 58 ක්) ණය ආපසු ගෙවීම් වන අතර ඉතිරි රුපියල් බිලියන 668 ( සියයට 42 ක) ප්‍රමාණය ණය පොළී ගෙවීම් නියෝජනය කරයි. පෙර වර්ෂයට වඩා 2018 වර්ෂයේදී ණය ආපසු ගෙවීම් හා පොළී ගෙවීම් පිළිවෙලින් රුපියල් බිලියන 281 කින් හා රුපියල් බිලියන 71 කින් වැඩිවී ඇත.

වගුව 8.5 : දේශීය ණය සේවාකරණ ගෙවීම්

(රු.මිලියන)

| වර්ෂය | ණය ආපසු ගෙවීම් | පොළී ගෙවීම් | එකතුව |
|---|---|---|---|
| 2017 | 648,134 | 597,020 | 1,245,154 |
| 2018 | 929,346 | 667,658 | 1,597,004 |

*මූලාශ්‍ර : භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව*

### 8.2.3 විදේශ මූල්‍යනය


ආර්ථිකයේ අපේක්ෂිත ආයෝජන හා වර්ධන මට්ටම ළඟා කර ගැනීම සඳහා හිඟ අයවැය මූල්‍යනය කරමින් ඉතුරුම් හා ආයෝජන මට්ටමේ අවාසිදායක පරතරය පියවා ගැනීම සඳහා විදේශ මූලාශ්‍රයන්ගෙන් අරමුදල් ලබා ගැනීම වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබයි. විදේශ මූල්‍යනය විදේශීය ණය හා විදේශ ප්‍රදාන ලෙස ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට වෙන් කළ හැක. ඒ අනුව 2018 වර්ෂයේදී විදේශීය ණය රුපියල් බිලියන 771.5 ක් ලෙසද විදේශ ප්‍රදාන රුපියල් බිලියන 12.5 ක් ලෙස ද වාර්තා කර ඇත. පසුගිය වසරට සාපේක්ෂව 2018 වසරේදී විදේශීය ණය හා විදේශ ප්‍රදාන පිළිවෙලින් 28.3 % කින් හා 55.7 % කින් වර්ධනය වී තිබුණි.

#### 8.2.3.1 විදේශීය ණය ගැනීම්

2018 වර්ෂයේ සමස්ත විදේශීය ණය ගැනීම් වටිනාකම විදේශීය වෙළඳපොළ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කිරීම් මඟින් රුපියල් බිලියන 391 කින්ද විදේශීය මූල්‍යන කාලීන සංකලිත ණය මඟින් රුපියල් බිලියන 171 කින්ද සංවර්ධන ප්‍රතිපත්ති , ව්‍යාපෘති හා වැඩසටහන් ණය රුපියල් බිලියන 210 කින්ද සමන්විතවී තිබුණි. වාසිදායක කොන්දේසි හා සාපේක්ෂව දිගු හා මැදි කාලීන කල් පිරීමේ කාල සීමාව හේතුවෙන් ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල වැදගත්කම වැඩිවී ඇත.

වගුව **8.6** : 2014 – 2018 දක්වා විදේශීය ණය ගැනීම් සංයුතිය - ණය මූලාශ්‍ර අනුව (රුපියල් බිලියන)

| **විදේශීය ණය මූලාශ්‍රය** | **2014** | **2015** | **2016** | **2017** | **2018** |
|---|---|---|---|---|---|
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර | 195.2 | 298.5 | 217.9 | 228.5 | 390.8 |
| විදේශීය මූල්‍යන කාලීන සංකලිත ණය | - | - | 101.8 | 152.7 | 170.9 |
| සංවර්ධන ප්‍රතිපත්ති, ව්‍යාපෘති හා වැඩසටහන් ණය | 227.3 | 257.9 | 254.5 | 220.1 | 209.8 |
| **එකතුව** | **422.5** | **556.4** | **574.2** | **601.3** | **771.5** |





මූලාශ්‍රය :- මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන

## 8.2.3.1.1 විදේශීය ණය සේවා ගෙවීම්

2017 වර්ෂයේ විදේශීය ණය සේවා ගෙවීම් රුපියල් බිලියන 357.8 ක්වූ අතර එය 2018 වර්ෂයේ රුපියල් බිලියන 491.5 ක් දක්වා එනම් 37.4% කින් වැඩිවිය. මෙම විදේශීය ණය සේවා ගෙවීම් වලින් රුපියල් බිලියන 307 ක් විදේශීය ණය ආපසු ගෙවීම් වන අතර ඉතිරි රුපියල් බිලියන 184.5 ක මුදල විදේශීය ණය පොළී ගෙවීම් වේ. පෙර වර්ෂයට සාපේක්ෂව 2018 වර්ෂයේ විදේශීය ණය ආපසු ගෙවීම් හා පොළී ගෙවීම් පිළිවෙලින් රුපියල් බිලියන 87.7 කින් හා රුපියල් බිලියන 46 කින් වැඩි වී ඇත.

වගුව 8. 7: විදේශීය ණය සේවා ගෙවීම් 2014 – 2018 (රුපියල් බිලියන)

| වර්ෂය | ණය ආපසු ගෙවීම් | ණය පොළී ගෙවීම් | එකතුව |
|---|---|---|---|
| 2014 | 107.0 | 69.9 | 176.9 |
| 2015 | 187.1 | 77.2 | 264.3 |
| 2016 | 145.1 | 101.1 | 246.2 |
| 2017 | 219.3 | 138.5 | 357.8 |
| 2018 | 307.0 | 184.5 | 491.5 |




මූලාශ්‍රය :- මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ මූලා ප්‍රකාශන

## 8.2.3.1.2 නොපියවූ විදේශීය ණය

2017 වර්ෂයේ අවසානයට නොපියවූ විදේශීය ණය වටිනාකම රුපියල් බිලියන 4,356.3 ක් වූ අතර එය 2018 වර්ෂයේ රුපියල් බිලියන 1,388.4 කින් වැඩි වී රු.5,744.7 ක් විය. ප්‍රධාන වශයෙන් වැඩසටහන් හා ව්‍යාපෘති ණය මඟින් මෙම නොපියවූ විදේශීය ණය ශේෂය සමන්විත වී තිබුණි.

වගුව 8.8 නොපියවූ විදේශීය ණය 2014 – 2018 (රුපියල් බිලියන)

| වර්ෂය | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|
| නොපියවූ විදේශීය ණය | 2,615.0 | 3,200.4 | 3,780.7 | 4,356.3 | 5,744.7 |

මූලාශ්‍රය :- මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ මූලා ප්‍රකාශන

## 8.2.3.1.3 විදේශාධාර ප්‍රදාන

සංවර්ධන පාර්ශ්වකරුවන් විසින් බහුපාර්ශ්වික හා ද්විපාර්ශ්වික මූලයයන් ලෙස අඛණ්ඩව ලබා දී ඇති විදේශාධාර ප්‍රදානයන් පිළිබඳ විස්තර පහත දක්වා ඇත. 2018 වර්ෂය තුල විදේශාධාර ප්‍රදාන රුපියල් බිලියන 12.48 දක්වා වැඩි වී ඇති අතර එය 55% ක වැඩි වීමක් පෙන්නුම් කරයි.

වගුව **8.9** : 2014 – 2018 දක්වා මුළු විදේශාධාර ප්‍රදාන පිළිබඳ වාර්තාව (රුපියල් බිලියන)

| වර්ෂය | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|
| වාර්තා කළ විදේශාධාර ලැබීම් | 9.40 | 6.01 | 7.50 | 8.03 | 12.48 |

## 8.3 භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත පවරා ඇති බදු නොවන ආදායම් එකතු කිරීම

භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් ආදායම් ශිර්ෂ **11** ක් සම්බන්ධව ආදායම් ගණන් දීමේ නිලධාරියා ලෙස කටයුතු කරන අතර, එයින් උප ණය මුදල් හි වාරික සහ පොලී ආදායම් රැස් කිරීම වෙනුවෙන් ආදායම් ශිර්ෂ 2ක් ද, විදේශ ප්‍රධාන හා භාණ්ඩාගාර සුරැකුම්පත් අධිමිල ආදායම් සඳහා ආදායම් ශීර්ෂ 2ක් ද, වෙන් කර ඇත. ඉතිරි ආදායම් ශිර්ෂ 07 විශේෂයෙන් එක් දෙපාර්තමේන්තුවකට හෝ අමාත්‍යාංශයකට පමණක් වෙන්කල නොහැකි ආදායම් රැස් කිරීම සඳහා පවත්වාගෙන යනු ලැබේ. සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළදී රුපියල් බිලියන **216.0** ක් වූ ඇස්තමේන්තුගත රජයේ මුළු බදු නොවන ආදායමෙන් සියයට **40.1** ක් එනම් රුපියල් බිලියන **86.6** ක මුදලක් පහත දක්වා ඇති බදු නොවන ආදායම් ශීර්ෂ **09** යටතේ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර තිබුණි.

වගුව 8.10 : භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් ආදායම් එකතු කිරීමේ නිලධාරියා ලෙස කටයුතු කරන බදු නොවන ආදායම් එකතු කිරීම 2017-2018

(රුපියල් මිලියන)

| ආදායම් විස්තරය | 2017 වර්ෂය | | 2018 වර්ෂය | |
|---|---|---|---|---|
| | ආදායම් ඇස්තමේ-න්තුව | රැස් කරන ලද ආදායම් | මුල් ආදායම් ඇස්තමේන්තුව | රැස් කරන ලද ආදායම |
| **බදු නොවන ආදායම්** | | | | |
| අනෙකුත් කල්බදු කුලී | 278.0 | 358.7 | 120.0 | 1,791.5 |
| උපණය සඳහා පොලී | 4,300.0 | 4,648.6 | 4,300.0 | 6,212.8 |
| වෙනත් පොලී ආදායම් | 1,650.0 | 2,746.8 | 1,300.0 | 1,927.6 |
| දෙපාර්තමේන්තු විකුණුම් | 110.0 | 120.7 | 117.0 | 162.3 |
| විවිධ පරිපාලනාත්මක ගාස්තු | 5,000.0 | 6,143.4 | 11,500.0 | 8,642.7 |
| දඩ හා රාජසන්තක කිරීම් - වෙනත් | 2,600.0 | 1,507.0 | 2,100.0 | 1,582.0 |
| අනෙකුත් ලැබීම් | 11,000.0 | 12,894.8 | 15,000.0 | 37,456.5 |
| අනෙකුත් වර්ථන පැවරීම් | 1,750.0 | 2,078.8 | 2,000.0 | 3,260.8 |
| ණය ආපසු අයකිරීම | 16,250.0 | 16,418.1 | 16,800.0 | 25,583.6 |
| ප්‍රාග්ධන වත්කම් විකිණීම | 100.0 | 144.1 | - | - |
| **බදු නොවන ආදායම් එකතුව** | **43,038.0** | **47,061.0** | **53,237.00** | **86,619.80** |


බදු නොවන ආදායම් ශීර්ෂ 09 හැරුණුකොට භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් ආදායම් ගණන්දීමේ නිලධාරී ලෙස කටයුතු කරන විදේශ ප්‍රදාන ආදායම් ශීර්ෂය යටතේ 2018 වර්ෂය තුළදී රුපියල් බිලියන 12.5 ක මුදලක් ද, භාණ්ඩාගාර සුරකුම්පත් අධිමිල ආදායම් ශීර්ෂය යටතේ 2018 වර්ෂය තුලදී රුපියල් මිලියන 582.2 ක මුදලක් ද, එකතු කිරීමට දෙපාර්තමේන්තුවට හැකි වී ඇත. මේ අනුව 2018 වර්ෂය තුළදී භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව මගින් ආදායම් ශිර්ෂ 11 ක් යටතේ රුපියල් බිලියන 99.7 ක මුදලක් රැස් කිරීමට කටයුතු කර තිබේ.

## 8.4 භාණ්ඩාගාර ඇපකර

රාජ්‍ය ව්‍යවසායන් ප්‍රධාන වශයෙන් සිය කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාගැනීම මෙන්ම වාණිජ කටයුතු වෙනුවෙන් අවශ්‍ය වන අරමුදල් දේශීය හා විදේශීය මුල්‍යායතන වෙතින් සම්පාදනය කර ගැනීමේදී ඒ සඳහා අවශ්‍ය වන භාණ්ඩාගාර ඇපකර, සහ ස්වෛරී ඇපකර 2003 අංක 3 දරන මුල්‍ය කළමනාකරණ (වගකීම්) පනත සහ එහි සංශෝධනයන් අනුව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කිරීමට කටයුතු කරනු ලබයි.

2018 වර්ෂය අවසාන වන විට රුපියල් බිලියන 1102.73 ක් වටිනා භාණ්ඩාගාර ඇපකර ප්‍රමාණයක් නිකුත් කර තිබුණි. මේ ආකාරයට නිකුත් කර ඇති භාණ්ඩාගාර ඇපකර වලින් 44.84% ක් නිකුත් කර ඇත්තේ විදුලිබල සහ බලශක්ති ක්ෂේත්‍රය වෙත කරනු ලබන ආයෝජනයන් ආවරණය කිරීම සඳහා වේ.

**රූප සටහන 8.5 : භාණ්ඩාගාර ඇපකරවල ආංශික සංයුතිය 2018**




## 8.5 භාණ්ඩාගාර උපණය

ලෝක බැංකුව (World Bank) ආසියානු සංවර්ධන බැංකුව (ADB), ජපාන අන්තර්ජාතික සහයෝගීතා ඒජන්සිය (JICA) වැනි විදේශ ණය ප්‍රදානය කරනු ලබන ආයතනයන් වෙතින් ලබා ගන්නා ණය මුදල් රජය වඩාත් පහසු කොන්දේසි යටතේ රටේ සංවර්ධන ක්‍රියාවලිය සඳහා අත්‍යාවශ්‍ය අංගයක් වන යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමේ යෙදී සිටින රාජ්‍ය ව්‍යවසායන් වෙත උපණය වශයෙන් සපයනු ලබයි. මෙසේ උප ණය වශයෙන් සපයනු ලබන ණය මුදල් සම්බන්ධ ණය වාරික හා පොළී ආදායම් රැස් කිරීම භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් සිදු කරන අතර මේ සම්බන්ධව මාසිකව යාවත්කාලීන කරනු ලබන දත්ත පද්ධතියක් ද දෙපාර්තමේන්තුව මගින් පවත්වා ගෙන යනු ලැබේ.

2018 වර්ෂය තුළ රුපියල් බිලියන 11.87 ක මුදලක් උපණය ලෙස නිදහස් කිරීමට සහ රුපියල් බිලියන 25.58 ක මුදලක් උපණය වාරික ලෙස ආපසු අයකර ගැනීමට දෙපාර්තමේන්තුවට හැකි විය. මීට අමතරව උපණය පොළී ආදායම වශයෙන් රුපියල් බිලියන 6.21 ක මුදලක් ද වර්ෂය තුළ දී අයකර ගෙන ඇත.

රාජ්‍ය ව්‍යාපාර, වාණිජ බැංකු, සංවර්ධන බැංකු, ප්‍රාදේශීය සංවර්ධන බැංකු ඇතුළු විවිධ රාජ්‍ය ආයතන 50 කට ආසන්න ප්‍රමාණයකට ලබාදුන් උපණය මුදලින් 2018 වර්ෂය අවසානයට ශේෂය රුපියල් බිලියන 184.16 කි.

**ආදායමෙන් ආපසු ගෙවීම.**

2018 වර්ෂය තුල රාජ්‍ය ආදායමින් ආපසු ලබා ගැනීම සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද අයදුම්පත් 1728 ක් සඳහා අනුමැතිය ලබා දී ඇති අතර ඒ අනුව ආපසු ගෙවන ලද මුළු මුදල රුපියල් බිලියන 1.2 කි.

## 8.6 භාණ්ඩාගාර කේවල ගිණුම් සහ භාණ්ඩාගාර මූල්‍ය කළමනාකරණ පද්ධතීන් වල ක්‍රියාකාරිත්වය

රජයේ දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ සතුව පවතින අරමුදල් වඩාත් ඵලදායීව හා කාර්යක්ෂමව කළමනාකරණය සඳහා නිසි බැංකු පද්ධතියක අවශ්‍යතාවය ප්‍රධාන සාධකයකි. දිවයිනේ බැංකු පද්ධතිය ජාලගතව සම්බන්ධ වීමත් සමග රාජ්‍ය මුදල් කළමනාකරණයේ කාර්යක්ෂමතාවය සහ ඵලදායීතාවය වඩාත් වැඩි දියුණු කළ හැකි රාජ්‍ය අරමුදල් කළමනාකරණ ක්‍රියාවලිය තුළ වැදගත් වන භාණ්ඩාගාර කේවල ගිණුම් ක්‍රමය 2007 වර්ෂයේ දී භාණ්ඩාගාරය මගින් හඳුන්වා දෙන ලදී.

ඒ අනුව 2018.12.31 දිනට භාණ්ඩාගාර කේවල ගිණුම් ක්‍රමය යටතේ සහ භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් නමින් පවත්වාගෙන යනු ලබන සමස්ථ නිල බැංකු ගිණුම් ප්‍රමාණය 2,144 ක් වූ අතර එය බැංකු අතර බෙදී ගිය ආකාරය පහත වගුවෙන් දැක්වේ.


වගුව 8.11 භාණ්ඩාගාර කේවල ගිණුම් ක්‍රමය යටතේ පවත්වා ගෙන යනු ලබන නිල බැංකු ගිණුම්

| | ලංකා බැංකුව | මහජන බැංකුව | ශ්‍රී ලංකා මහ බැංකුව | එකතුව |
|---|---|---|---|---|
| කේවල ගිණුම් පද්ධතිය යටතේ පවතින නිල ගිණුම් | 1,380 | 729 | 0 | 2,109 |
| භා.නි.ලේ.නමින් පවත්වාගෙන යනු ලබන ප්‍රධාන නිල බැංකු ගිණුම් | 1 | 1 | 10 | 12 |
| කේවල ගිණුම් පද්ධතියෙන් පිටත දේශී ය ආදායම් දෙපාර්තමේන්තුව නමින් පවත්වාගෙන යනු ලබන රැස් කිරීමේ ගිණුම් | 17 | 6 | 0 | 23 |
| මුළු එකතුව | 1,398 | 736 | 10 | 2,144 |

ඒකාබද්ධ අරමුදල යටතේ ක්‍රියාත්මක වන රජයේ නිල බැංකු ගිණුම් ක්‍රියාත්මක කිරීම භාණ්ඩාගාර කේවල ගිණුම් පද්ධතිය යටතට ගැනීම හේතුවෙන් බැංකු සමග කරනු ලබන මූල්‍ය ගනුදෙනු සාපේක්ෂව සහ ආර්ථිකමය වශයෙන් ඵලදායීව සිදු කිරීමටත්, බැංකු අයිරා හා ඒ මත දැරීමට සිදු වන පොලී වියදම ද අඩු කර ගැනීමටත් හැකි විය. මෙමගින් දිවයින පුරා විහිදී ගිය නිල බැංකු ගිණුම් වල නිකරුනේ මුදල් රැඳීමේ තත්වයන් (idle cash balances) ඇති වීම වළකා ගත හැකි වේ.

සාමාන්‍යයෙන් රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල බැංකු ගිණුම්වල පවතිනු ලබන දෛනිකව භාවිතා නොකල බැර ශේෂය 2018 වර්ෂයේ දී රුපියල් බිලියන 47.29 කට ආසන්න අගයක් ගන්නා ලදී. එම ශේෂය මෙම ගිණුම් පද්ධතිය මගින් භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ගිණුමට තාවකාලිකව බැර කිරීම මගින් අයිරා පොළී වියදම රුපියල් බිලියන 4.80 කින් ඉතිරි කර ගැනීමට හැකි විය. මෙම ගිණුම් පද්ධතිය ක්‍රියාත්මක නොවී නම් මුළු අයිරා පොළිය 34.36 % කින් ඉහල යාමට ඉඩ තිබුණි. මෙය ප්‍රස්තාරය මගින් පිළිබිඹු වේ.

රූපසටහන 8.6 : භාණ්ඩාගාර කේවල ගිණුම් පද්ධතියේ කාර්යසාධනය - 2018




## 8.7 දේපල ණය ඇපකර අරමුදල

2005 වර්ෂයේ අයවැය යෝජනාවක් අනුව සෑම රජයේ සේවකයකුටම වටිනා වත්කමක් ලබා දීම අරමුණු කර ගෙන නිවාසයක් හිමිකර ගැනීම සඳහා බැංකු ක්‍රමය උපයෝගී කර ගෙන නව ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. මේ යටතේ ණය ලබා ගත් නිලධාරියකු මියගියේ නම් හෝ පූර්ණ අකර්මන්‍ය තත්වයට පත්වූයේ නම් ණය ශේෂය පියවීම සම්බන්ධව බැංකුව වෙත ඇතිවන අවදානම සමනය කිරීම සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව භාරයේ ණය ඇපකර අරමුදල පිහිටුවන ලදී.

ඒ අනුව මූලික ආයෝජනය ලෙස 2005.08.05 දින රු.මිලියන 916 ක මුදලක් භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජනය කර මෙම අරමුදල ස්ථාපනය කරන ලදී. 2018.12.31 දින වන විට මෙම ආයෝජනය රු.මිලියන 1,385 දක්වා වර්ධනය වී ඇත.

වගුව 8.12 : දේපල ණය ඇපකර අරමුදලින් ණය ශේෂ පියවීමේ ප්‍රගතිය 2005 - 2018

| වර්ෂය | 2005 - 2016 | 2017 | 2018 | එකතුව |
|---|---|---|---|---|
| මියගිය නිලධාරි සංඛ්‍යාව | 509 | 72 | 81 | 662 |
| පූර්ණ අකර්මන්‍ය වූ සහ වෛද්‍ය හේතුමත විශ්‍රාම ගැන්වූ නිලධාරි සංඛ්‍යාව | 36 | 06 | 03 | 45 |
| පියවන ලද මුළු මුදල රු. මිලියන | 423.5 | 59 | 69 | 551.5 |

ඉහත වගුවේ විස්තර අනුව මෙම අරමුදල ආරම්භයේ සිට 2018.12.31 දින දක්වා මියගිය / පූර්ණ අකර්මන්‍යතාවය / සෞඛ්‍ය හේතුන් මත විශ්‍රාම ගන්වන ලද රාජ්‍ය නිලධාරින් 707 දෙනෙකු වෙනුවෙන් පැවති ණය ශේෂයන් එකවර පියවීම් වශයෙන් රු.මිලියන 551.5 ක මුදලක් අදාල රාජ්‍ය බැංකු වෙත ගෙවා තිබේ. මෙම අරමුදල කාර්යක්ෂමව කළමණාකරණය කිරීම තුලින් ඉදිරියේ දී රාජ්‍ය සේවකයින්ගේ අභිවෘද්ධිය සඳහා වන තවත් සහනයන් ක්‍රියාත්මක කිරීමට රජයට සහය විය හැකි වෙතැයි දෙපාර්තමේන්තුව අපේක්ෂා කරයි.

## 8.8 භාණ්ඩාගාර මූල්‍ය කළමණාකරණ පද්ධතිය (TFMS)

භාණ්ඩාගාර මෙහෙයුම් පද්ධතිය මගින් ලබාගත යුතු වන මූල්‍ය කළමනාකරණ තොරතුරු අවශ්‍යතාවන් සපුරාගත හැකි වන පරිදි හා පද්ධතිය පරිශීලනය කරනු ලබන අයට භාවිතය වඩාත් පහසු වන ලෙස භාණ්ඩාගාර මූල්‍ය කළමනාකරණ පද්ධතිය (TFMS) 2008 වර්ෂයේදී හඳුන්වාදෙන ලදී. අභ්‍යන්තර කළමනාකරණ රැස්වීම් වලදී ආයතනයේ පද්ධතීන් වැඩිදියුණු කිරීම පිළිබඳව නිරන්තරව කරනු ලබන සාකච්ඡාවන් හි ප්‍රතිඵලයන් ලෙස අදාල මෙහෙයුම් පද්ධති සම්බන්ධව තාක්ෂණික පසු විපරම් කරනු ලබන සේවා ආයතනයේ නිරන්තර සම්බන්ධතාවයන් ලබා ගනිමින් 2018 වර්ෂයේදී ද අදාල පද්ධතිය තවදුරටත් ආයතන අවශ්‍යතා අනුව යාවත්කාලීන කිරීම සිදුකරන ලදී. මෙම පද්ධතිය තුලින්ම අවශ්‍ය කළමනාකරණ තොරතුරු කාලීනව ලබාගත හැකි වීම දෙපාර්තමේන්තුවේ දෛනික මූල්‍ය කළමනාකරණ තීරණ ගැනීමෙහිලා වඩාත් ඵලදායීව ඉවහල් වේ. මෙමගින් ඒකාබද්ධ අරමුදලට අයත් සියළු ගණුදෙනු, ලැබීම හා ගෙවීම සිදු කල හැකි අතර, දිනය අවසානයේදී මුදල් තත්වය පිළිබඳ සමස්ත ඇගයීමක් සඳහා අවශ්‍ය තොරතුරු සපයනු ලබන බැවින් කළමනාකරණ උපාංගයක් ලෙස මෙම පද්ධතිය මගින් ජනනය කරනු ලැබූ තොරතුරු ඵලදායී තීරණ ගැනීම සඳහා ඉහළ කළමනාකාරීත්වයට මනා පිටුවහලක් විය.

2018 වර්ෂයේ දී අන්තර් බැංකු ගනුදෙනු හැර රුපියල් බිලියන 5,815.0 ක මුළු ලැබීම් හා රුපියල් බිලියන 5,826.0 ක මුළු ගෙවීම් මෙම දෙපාර්තමේන්තුව මගින් සිදු කර ඇත. ලැබීම් බිලියන 5,815.0 න් 99.45% (බිලියන 5,782.9) ක ප්‍රමාණයක් සිදු කරන ලද්දේ චෙක්පත් භාවිතා නොකර විද්‍යුත් මුදල් හුවමාරු කිරීම් මගිනි. තවද ගෙවීම් බිලියන 5,826.0 න් 98.84% (බිලියන 5,758.3) විද්‍යුත් ගෙවීම් පහසුකම් යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව, ලංකා බැංකුව හා මහජන බැංකුව හරහා සිදුකර ඇත. මෙම ලැබීම් හා ගෙවීම් සිදු කරන ලද්දේ මුදල් ලැබීම් වවුචර් 6072 කින් හා ගෙවීම් වවුචර් 18168 කිනි. ඊට අමතරව තත්කාලීන දළ පියවුම් ක්‍රමය හරහා ගනුදෙනු 343 ක් මගින් රුපියල් බිලියන 1,450.2 ක මුදලක අන්තර් බැංකු හුවමාරු සිදුකර ඇත.

## 8.9 අනාගත අභියෝග ජය ගැනීම සඳහා වූ උපාය මාර්ග

### ඒකාබද්ධ භාණ්ඩාගාර තොරතුරු පද්ධතිය (ITMIS)

ඒකාබද්ධ භාණ්ඩාගාර තොරතුරු පද්ධතිය (ITMIS) හඳුන්වාදීම මඟින් ඵලදායි අයවැය කළමනාකරණය, බැඳීම් පාලනය, මුදල් කළමනාකරණය සහ මූල්‍ය විනයේ සංවර්ධනයක් අපේක්ෂා කෙරේ. මීට අමතරව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) සමඟ එක්ව රටේ මහජන අරමුදල් පහසුකම් (EFF) වැඩසටහන සඳහා ව්‍යුහාත්මක ප්‍රමිතියක් ඇති කිරීමට බලාපොරොත්තුවේ. භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව මෙම ITMIS වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී සම සාමාජිකයකු ලෙස ඵලදායි කාර්යභාරයක් ඉටුකරනු ලබන අතර විශේෂයෙන්ම ධාරිතා සංවර්ධනය, යටිතල පහසුකම් සංවර්ධනය යන කටයුතු සහ ගෙවීම් ඒකකය ලෙස ක්‍රියාත්මක වේ.